# මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
# நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
# MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01.
இலங்கை.

The Secretariat, Colombo 01.
Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700

ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.:

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2024.06. 04

චක්‍රලේඛ අංකය : DFD/ 2024-I (I)

ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
සියලුම දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන්

**අඩු ආදායම්ලාභී පවුල් වෙත බෙදාදීම සඳහා අවශ්‍ය සහල් මිලදී ගැනීම**

අඩු ආදායම්ලාභී පවුල් වෙත බෙදාදීම සඳහා අවශ්‍ය සහල් මිලදී ගැනීම සම්බන්ධයෙන් මා විසින් නිකුත් කරන ලද අංක DFD/ 2024-I හා 2024.04.04 දිනැති චක්‍රලේඛය හා බැඳේ.

'අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම' යන මැයෙන් ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අංක 24/1064/601/038-II හා 2024.06.03 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබාදෙන ලද 2024.06.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අඩු ආදායම්ලාභී පවුල් වෙත දෙවන අදියර යටතේ බෙදාදීමට අවශ්‍ය සහල් පහත මිලගණන් යටතේ සුදුසුකම් ඇති සහල් සැපයුම්කරුවන්ගෙන් මිලදීගෙන ප්‍රතිලාභීන් වෙත බෙදාදීම සඳහා අනුමැතිය ලබාදී ඇත.

| සහල් වර්ගය | සහල් මිලදී ගැනීමේ මිල (කිලෝ 10 ක බෑගයක් සඳහා රුපියල්) |
|---|---|
| නාඩු - රතු කැකුළු | 1,860.00 |
| නාඩු - සුදු කැකුළු | 1,950.00 |
| රතු/සුදු නාඩු - තම්බන ලද | 2,050.00 |

ඒ අනුව, අංක DFD/ 2024-I හා 2024.04.04 දිනැති චක්‍රලේඛයේ 2.2හි සඳහන් සහල් මිල ගණන් ඉහත පරිදි සංශෝධනය කරනු ලබන අතර අඩු ආදායම්ලාභී පවුල් වෙත සහල් බෙදාදීමේ වැඩසටහනේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීමේදී මෙම සංශෝධිත මිල ගණන් අදාළ කර ගැනීමට සියලු දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරු විසින් කටයුතු කළ යුතුය.

වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

ඉහත මිල සංශෝධනයට අමතරව, මාගේ උක්ත චක්‍රලේඛයේ සඳහන් උපදෙස් ප්‍රකාරව 2024 අප්‍රේල් මාසයේ ප්‍රතිලාභීන් වෙත සහල් බෙදාදීම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් අනුගමනය කරන ලද ක්‍රමවේදය ඒ ආකාරයෙන්ම දෙවන අදියර යටතේ සහල් බෙදාදීමේ කටයුතු සඳහා ද අදාළ කරගත යුතුය.

එම උපදෙස්වලට අමතරව දෙවන අදියර යටතේ සහල් බෙදාදීමට අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමේදී පහත උපදෙස් අනුගමනය කළ යුතුය.

1. එක් එක් දිස්ත්‍රික්කය සඳහා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද ප්‍රමාණයට වඩා යම් දිස්ත්‍රික්කයක ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව වැඩිවී ඇත්නම්, එම අදාළ දිස්ත්‍රික් ලේකම්/දිසාපති විසින් වැඩිවූ පවුල් සංඛ්‍යාවට අදාළව නැවත කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගත යුතුය. එසේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව පළමුවර සහල් බෙදාදීමේදී සිදුකළ ආකාරයටම සහල් මිලදීගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලීම් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත යොමුකළ යුතුය.

2. අප්‍රේල් මාසයේ සහල් මිලදීගැනීමට අදාළව ලබාගන්නා ලද ප්‍රතිපාදන/අක්මුදල්වල ඉතිරියක් පවතින්නේද යන්න සොයාබලා එසේ ඉතිරිව පවතින්නේ නම් එම මුදල් සහල් බෙදාහැරීමට අදාළ ප්‍රවාහන හා අනෙකුත් හැසිරවීමේ වියදම් සඳහා භාවිතා කළ යුතුය (අදාළ වියදම් සඳහා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව). තවද, එසේ ලබාගන්නා ලද අරමුදල්වල තවදුරටත් ඉතිරියක් පවතින්නේ නම් එම ප්‍රමාණය අඩුකර දෙවනවර සහල් මිලදීගැනීම සඳහා ප්‍රතිපාදන ඉල්ලුම්කළ යුතුය.

මාගේ අංක DFD/ 2024-I හා 2024.04.04 දිනැති චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් උපදෙස්වල කිසිදු වෙනසක් සිදු නොවේ.

කේ.එම්.මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කරු.දැ.ගැ.ස.
2. ලේකම්, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
3. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස සහ අ.ක.ස.
4. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
5. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
6. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
7. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
8. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
9. කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
10. සභාපති, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
11. අධ්‍යක්ෂ, ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.
12. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය - කරු.දැ.ගැ.ස.